// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2079/13 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 2037/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 1995 නොවැම්බර් මස 07 වන දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, ශ්‍රී ලංකාවේ රජරට විශ්වවිද්‍යාලයට අදාළව එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද එකී විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වන්නා වූ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කළමනාකරණ අධ්‍යයන පීඨය " යන අයිතමයට අනුරූපීව එහි II වන තීරයේ දැක්වෙන "2. ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් එකතු කිරීම මගින් :-

   "3. අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයන අංශය,
   4. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය." ;

2. එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යවහාරික විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපීව එහි II වන තීරයේ දැක්වෙන "4. ගෘහ විද්‍යා අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් එකතු කිරීම මගින් :-

   "5. සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයන අංශය
   6. පරිගණක අධ්‍යයන අංශය." ;

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

07 -794

1A - PG 4114 — 508 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*